සියලුම හිමිකම් ඇවිරිණි

2024.08.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024

**8 - ශ්‍රේණිය** **ගණිතය**

| නම - ............ | 1 - කොටස | 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න<br>එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ |
|---|---|---|

1) 20, 17, 14, 11,..... යන සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

2) $2x + 1 = 7$ යන සමීකරණය විසඳන්න.

3) $(-7) - (+2)$ හි අගය සොයන්න.

4) දී ඇති රූපයේ අඳුරු කර ඇති භාගය, ප්‍රතිශතයක් ලෙස දක්වන්න.



5) සමපාද ත්‍රිකෝණයක පරිමිතිය $24cm$ ක් නම් එක් පාදයක දිග සොයන්න.

6) ශ්‍රී ලංකාවේ වේලාව පෙ.ව. 7.00 විට ඕස්ට්‍රේලියාවේ මෙල්බන්හි වේලාව සොයන්න. (ශ්‍රී ලංකාවේ කාල කලාපය $\left(+5\frac{1}{2}\right)$ හා ඕස්ට්‍රේලියාවේ මෙල්බන්හි කාල කලාපය $(+10)$ වේ.)

7) පහත දී ඇති කුලක අතුරින් අභිගුනාය කුලක තෝරා ඒවා යටින් ඉරක් අඳින්න.

- 0 ත් 10 ත් අතර ඇති 20හි ගුණාකාර
- පාද ගණන 10ට අඩු බහුඅස්‍ර
- ඉංග්‍රීසි හෝඩියේ ස්වර
- මීටර 5ට වඩා උස මිනිසුන්

8) $\sqrt{225}$ හි අගය සොයන්න.

9) $25^0$ ක් වූ කෝණයක, පරිපූරක කෝණය වටා රවුමක් අඳින්න. අනුපූරක කෝණය වටා කොටුවක් අඳින්න.

$65^0$ $55^0$ $125^0$ $155^0$

10) දී ඇති ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.




11) $a = 2, b = 4$ විට, $8a - 3b$ යන වීජීය ප්‍රකාශනයේ අගය සොයන්න.

12) පහත ගුණිතය දර්ශක අංකනයෙන් ලියන්න.

$a \times a \times 2 \times b \times a \times 2 \times b =$

13) $2.05t$ යන ස්කන්ධය ටොන් හා කිලෝග්‍රෑම්වලින් දක්වන්න.

14) පන්තියක පිරිමි ළමුන් 20ක් හා ගැහැණු ළමුන් 25 ක් සිටියි. පිරිමි ළමුන් හා ගැහැනු ළමුන් අතර අනුපාතය ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න.

15) $25 \times 12 = 300$ නම් $2.5 \times 1.2$ හි අගය සොයන්න.

16) $5x + 10y$ හි සාධක සොයන්න.

17) ද්විපාර්ශ්වික සමමිතියක් නැති, භ්‍රමක සමමිතියක් ඇති තලරූපය තෝරන්න.

සවිධි පංචාස්‍රය , සමාන්තරාස්‍රය , රොම්බසය

18) $\frac{3}{5} \times \frac{2}{7}$ සුළු කරන්න.

19) සවිධි අෂ්ඨතලයේ එක් මුහුණතක හැඩය ලියා දක්වන්න.

20) $y$ හි අගය සොයන්න.



# II - කොටස

- පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක්ද, ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින්ද හිමිවේ.

1) $a)$ ත්‍රිකෝණ හා චතුරස්‍ර පාඩමේදී ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




ඉහත රූප සටහන් ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

i. $p+q+r =$ ............... වේ. (ලකුණු - 1)

ii. ඒ ඇසුරෙන් ත්‍රිකෝණයක ................. කෝණවල ඓක්‍යය $180^0$ ක් වේ. (ලකුණු - 1)

iii. $p$ හි අගය සොයන්න. (ලකුණු - 3)




$(b)$ $(i)$ $AB$ හා $CD$ යනු සරල රේඛා ඛණ්ඩ දෙකකි.
$a$ හා $b$ හි අගය සොයන්න. (ලකුණු - 3)




$(ii)$ $PT$සරල රේඛාවකි. $x$ හි අගය සොයන්න.
ඒ ඇසුරෙන් $R\hat{S}T$ හි අගය සොයන්න. (ලකුණු - 4)




$(iii)$ $y$ හා $z$ හි අගය සොයන්න. (ලකුණු - 4)




2) $(a)$ පහත රූපවලින් දැක්වෙන ඝනවස්තු ඇසුරින් දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

$(i)$  $(ii)$  $(iii)$ 

| | ප්ලේටෝ කැටය | ඝනවස්තුවේ එක් මුහුණතක හැඩය | ඝනවස්තුවේ එක් ශීර්ෂයකදී හමුවන මුහුණත් ගණන |
|---|---|---|---|
| $(i)$ රූපය | | | |
| $(ii)$ රූපය | | | |
| $(iii)$ රූපය | | | |

(ලකුණු - 9)

$(b)$ ශීර්ෂ ගණන 9ක් හා දාර ගණන 16ක් වූ ඝනවස්තුවක ඇති මුහුණත් ගණන ඔයිලර් සම්බන්ධතාවය ඇසුරින් සොයන්න. (ලකුණු - 2)

3) පහත රූපයේ දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රයක් හා ත්‍රිකෝණයකින් සමන්විත සංයුක්ත රූපයකි.

*i)* මෙම තලරූපයේ පරිමිතිය සොයන්න. (ලකුණු -2)




*ii)* මෙම සංයුක්ත තලරූපයේ වර්ගඵලය සොයන්න. (ලකුණු -5)

*iii)* දිග, පළල හා උස පිළිවෙළින් $10cm$, $6cm$ හා $4cm$ වූ ඝනකාභයක මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න. (ලකුණු 4)

4) $(i)$ $\frac{3}{8}+\frac{1}{12}$ සුළු කරන්න. (ලකුණු - 2)

$(ii)$ $3\frac{1}{2}\times 2\frac{5}{7}$ සුළු කරන්න. (ලකුණු - 2)

$(iii)$ $18m$ දිග රිබන් පටියකින්, $1\frac{1}{2}m$ ක් දිග රිබන් කැබලි කීයක් කැපිය හැකිද ? (ලකුණු - 3)

$(iv)$ බීම බෝතලයක ධාරිතාවය $1.25l$ වේ. එවැනි බීම බෝතල් 3ක් මිනිසුන් 10 දෙනෙකු අතර සමසේ බෙදුවේ නම් එක් අයෙකුට ලැබෙන බීම ප්‍රමාණය මිලිලීටරවලින් සොයන්න. (ලකුණු - 4)

5) $(a)$ පහත සමීකරණ විසඳන්න.

$(i)$ $\frac{y}{2}+3=8$ $(ii)$ $2(m+3)=12$ (ලකුණු - 6)

$(b)$ $3a\times 2b\times 4c$ සුළු කරන්න. (ලකුණු - 2)

$(C)$ $5(2x+3)-4(x-3)$ වරහන් ඉවත් කර සුළු කරන්න. (ලකුණු - 3)

6) $(a)$ $\in$ හෝ $\notin$ යොදා ගනිමින් හිස්තැන් පුරවන්න.

i. 9 ________________ {ප්‍රථමක සංඛ්‍යා}

ii. ගම්පහ____________ {බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක}

iii. පංචාස්‍රය __________ {චතුරස්‍ර} (ලකුණු - 3)

$(b)$ පහත කුලකවල අවයව, ලයිස්තුගත කර වෙන් රූපසටහන්වල දක්වන්න.

$(i)$ $A=\{$ "මහරගම" යන වචනයේ අකුරු$\}$

$(ii)$ $B=\{$ 12 හි සියලුම සාධක$\}$

$(iii)$ $C=\{$ "2024204" යන සංඛ්‍යාවේ ඉලක්කම්$\}$ (ලකුණු - 6)

$(c)$ ඉහත $A$ හා $B$ යන කුලකවල $n(A)$, $n(B)$ ලියා දක්වන්න. (ලකුණු - 2)

7) 2024 ජනවාරි 01 වන දින නිමල් රුපියල් 12000 ක් යොදා රසකැවිලි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඊට මාස 4 කට පසු පියල් රුපියල් 20000ක් යොදා එම ව්‍යාපාරයට හවුල් විය. වසර අවසානයේදී ලැබුණ ලාභ මුදල රු 19000 කි.

i. නිමල් ව්‍යාපාරය සඳහා මුදල් යෙදවූ කාලය සොයන්න. (ලකුණු - 2)

ii. පියල් ව්‍යාපාරය සඳහා මුදල් යෙදවූ කාලය සොයන්න. (ලකුණු - 2)

iii. වසර අවසානයේදී ඔවුන් දෙදෙනා අතර ලාභය බෙදිය යුතු අනුපාතය සොයා එය සරලම ආකාරයෙන් දක්වන්න. (ලකුණු - 3)

iv. ඉහත අනුපාතයට අනුව දෙදෙනාට ලැබුණ ලාභය වෙන වෙනම සොයන්න. (ලකුණු - 4)



REGISTRAR
De Mazenod College
Kandana.